**ලාහුගල ප්‍රාදේශීය සභාව - 2023**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ලාහුගල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ලාහුගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන

වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක හා සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේ මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට පැවති ආයෝජන ගිණුමේ ශේෂය රු.1,209,902ක් හේතු හඳුනා ගැනීමකින් හෝ අනුමැතිය ලබා ගැනීමකින් තොරව ජ'නල් 27 මඟින් ප්‍රාග්ධන යෙදවුමෙන් ආදායමට දායක වීමේ ගිණුමට හර කර කපා හැර තිබුණි. | ලේකම්ගේ අනුමැතිය අනුව ප්‍රාග්ධන යෙදවුමෙන් ආදායමට දායක වීමේ ගිණුමට හර කර ඇත. ඉදිරියේ දී මෙය නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ඉඩම් හා ගොඩනැගිලි | 87,152,217 | (i) ඉඩම් ඔප්පු<br>(ii) සමීක්ෂණ වාර්තා<br>(iii) යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය | ඉඩම් ඔප්පු හා සමීක්ෂණ වාර්තා ලබා ගැනීමටත්, ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන කිරීමටත් ඉදිරියේ දී කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | යන්ත්‍ර හා උපකරණ | 18,720,533 | වටිනාකම සමඟ යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | - එම - |
| (ඇ) | මොටර් රථ හා කරත්ත | 27,220,000 | | | |
| (ඈ) | ලී බඩු සවි කිරීම් | 7,385,893 | | | |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති සහ රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | | |

| | | | | |
|---|---|---|---|---|
| (i) | 128 වගන්තිය | ප්‍රාදේශීය සභාව විසින් භාවිතා කරනු ලබන ඉඩම්වල අයිතිය ප්‍රාදේශීය සභාව නමට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම්වල අයිතිය පවරා ගැනීමට ඉදිරියේ දී කටයුතු කරන බව. | ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | 134 වගන්තිය | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි සංවර්ධිත ප්‍රදේශ කාලීනව හඳුනා ගනිමින් නව ආදායම් මූලාශ්‍ර හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා වෙත ඉල්ලීම් කර ඇති නමුත් මේ වන තෙක් අනුමත කර නොමැති බව. | - එම - |
| (ආ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් (EPF) පනත සහ 1980 සේවක භාරකාර අරමුදල් (ETF) පනත | දළ වැටුප මත පදනම්ව දායක මුදල් ගණනය කළ යුතු වුවත් ප්‍රාදේශීය සභාව විසින් මූලික වැටුප මත පදනම්ව දායක මුදල් ගණනය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළව සේවක අර්ථසාධක අරමුදල් රු.23,908ක් සහ භාරකාර අරමුදල් රු.3,586ක් අඩුවෙන් ගණනය කොට අරමුදල් වෙත මුදල් යවා තිබුණි. | 2024 වර්ෂයේ සිට දළ වැටුප මත පදනම්ව දායක මුදල් ගණනය කරමින් ඒවා අදාළ ආයතන වෙත යොමුකරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1988 ප්‍රදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| (i) | 5(12) රීතිය | මුදල් හා ගබඩා කටයුතු පිළිබඳව වගකිව යුතු නිලධාරීන් වෙතින් ප්‍රමාණවත් ඇපකර ලබා ගැනීමට පියවර ගෙන නොතිබුණි. | ඇපකර ලබා ගැනීමට නිලධාරීන්ව ලිඛිතව දැනුවත් කර ඇති අතර ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය හා පරිපාලන රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | 59 රීතිය | සභාවේ ආදායම් පරීක්ෂකවරයා විසින් සෑම වර්ෂයක් ආරම්භයේදීම බල ප්‍රදේශය තුළ පවතින වෙළඳ ව්‍යාපාර හා කර්මාන්ත පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කර මාර්තු 31 දිනට ප්‍රථම සභාවේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත් | වර්ෂ කිහිපයක සිට ආදායම් පරීක්ෂකවරයෙක් නොමැති බැවින් මෙම සමීක්ෂණය සිදුකිරීමට නොහැකි බව. | - එම - |

| | | | |
|---|---|---|---|
| | ඒ අනුව කටයුතු කර නොතිබුණි. | | |
| (iii) 218 රීතිය | සභාව සතු සියලු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව සෑම වර්ෂයකටම වරක් හෝ පරීක්ෂා කරවීමට කටයුතු කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | - එම - |
| (ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (i) මුදල් රෙගුලාසි 371 | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අත්තිකාරම් ලබා දී වර්ෂ 10 සිට වර්ෂ 25 දක්වා කාලයක් ගතව ඇති රු.83,500ක අත්තිකාරම් මුදල් ලබාගත් නිලධාරීන් පිළිබඳ තොරතුරු සභාව සතුව තිබිය දී එම ශේෂ නිරවුල් කිරීමට කටයුතු නොකර දිගින් දිගටම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එමින් පැවතුණි. | අත්තිකාරම් මුදල් ලබාගත් නිලධාරීන් වෙත ලිඛිතව දැනුම් දී ඇති අතර මෙම වර්ෂය තුළ එම මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | ප්‍රමාදයකින් තොරව අත්තිකාරම් පියවීමට කටයුතු කළ යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 571 (1), (2), (3) | තැන්පත් කර වසර 02ක කාලය ඉක්මවා තිබූ රු.1,184,495ක් වටිනා තැන්පතු ශේෂ අදාළ පාර්ශවයන් වෙත නිදහස් කිරීමට හෝ මුදල් රෙගුලාසි ප්‍රකාරව ආදායමට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පැහැදිලි තොරතුරු නොමැති බැවින් ආදායමට බැර නොකළ අතර මෙම වර්ෂයේ දී මුදල් රෙගුලාසි ප්‍රකාරව ආදායමට ගැනීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3 ඡේදය | වාහන ඉන්ධන දහන පරීක්ෂාව මාස 12කට වරක් හෝ කිලෝමීටර් 25,000ක දුර ධාවනය කිරීමෙන් පසුව පරීක්ෂා කළ යුතු වුවත් සභාව සතු වාහන සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි. | සේවක පුරප්පාඩු හා මූල්‍යමය තත්ත්වය අඩු නිසාවෙන් මෙම කාර්යය සිදුකිරීමට නොහැකි වූ බැවින් ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.7.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1987 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා සභාව විසින් රැස්කළ මුද්දර බදු වටිනාකම රු.106,002ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත යැවීමට කටයුතු නොකර පොදු තැන්පතු ගිණුමේ රඳවා තබාගෙන තිබුණි. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කොට මෙම වසරේ දී නිරවුල් කිරීමට කටයුතු කරන බව. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත මුදල් යැවීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.1,325,408ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.703,641ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභාවට අයත් බැංකු ගිණුම් දෙකකට අදාළ බැංකු සැසඳුම් වාර්තාවවල දිගින් දිගටම ඉදිරියට ගෙන එමින් පැවති රු.116,935ක ශේෂ 05ක් නිරවුල් කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | මෙම අගයන් වර්ෂ ගණනාවක සිට පැවත එන අතර ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මෙම ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

### 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i. | වරිපනම් හා බදු | - | - | - | - | - | - | - | - |
| ii. | කුලී | 2,941,000 | 1,601,612 | 1,666,912 | 53,370 | 1,891,000 | 490,512 | 350,663 | 118,670 |
| iii. | බලපත්‍ර ගාස්තු | 520,000 | 214,900 | 214,900 | 26,563 | 425,000 | 157,500 | 157,500 | 26,563 |
| iv. | වෙනත් ආදායම් | 521,000 | 380,349 | 380,349 | - | 700,000 | 246,264 | 246,264 | - |
| | එකතුව | **3,982,000** | **2,196,861** | **2,262,161** | **79,933** | **3,016,000** | **894,276** | **754,427** | **145,233** |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු කාරණා හඳුනාගෙන අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කර නොතිබුණු අතර 2023 දෙසැම්බර් 31 දින වන විට අතුරු ව්‍යවස්ථා 05 ක් පමණක් පනවා තිබුණි. | ඉදිරියේ දී අතුරු ව්‍යවස්ථා පැනවීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව. | අතුරු ව්‍යවස්ථා පනවා කටයුතු නීත්‍යානුකූල කරගත යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතු බැංකු ගිණුම්වල පවතින රු.5,000,000ක මුදල් සංචිතවලින් පුනරාවර්තන වියදම් පියවීම සඳහා ප්‍රමාණවත් මුදලක් තබාගෙන අතිරික්ත මුදල් ආදායමක් උපයා ගත හැකි මූලාශ්‍රවල ආයෝජනය කර ආදායමක් උපයා ගැනීමට ලේකම්වරයා විසින් කටයුතු කර නොතිබුණි. | මෙම වර්ෂයේ දී රු.3,000,000ක මුදලක් ස්ථාවර තැන්පතු දැමීමට කටයුතු කරන බව. | අතිරික්ත මුදල් ආයෝජනය කර ආදායම් ඉපයිය යුතුය. |

### 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (ආ) | ප්‍රාදේශීය සභාවට අයත් ගොඩනැගිලි වටිනාකම ගිණුම්ගත කර තිබුණ ද එම ගොඩනැගිලි පිහිටි ඉඩම්වල වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | ඉඩම්වල වටිනාකම ඉදිරියේදී හඳුනා ගැනීමට කටයුතු කරන බව. | ඉඩම් වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සභාව සතුව පවතින රථවාහන 13ක් අලුත්වැඩියා කර නැවත භාවිතා කිරීමට හෝ අලුත්වැඩියා කළ නොහැකි වාහන සුදුසු පරිදි අපහරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් එම රථවාහන නිෂ්කාර්යව පැවතුණි. | අඩු ආදායම් ලබන සභාවක් බැවින් අලුත්වැඩියා කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන නොමැති බැවින් අලුත්වැඩියා කිරීමේ ප්‍රමාදයන් පවතින බව. | රථ වාහන අලුත්වැඩියා කර නැවත භාවිතයට හෝ අලුත්වැඩියා කළ නොහැකි වාහන වෙන්දේසියේ විකිණීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සභාව විසින් භාවිතා කරනු ලබන රථවාහන 15ක අයිතිය සභාවේ නමට පවරා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වාහන පවරා ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව. | වාහනවල අයිතිය සභාව නමට පවරා ගත යුතුය. |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) කසල බඳුන් මිලදීගැනීම** | | |
| සමාලෝචිත වර්ෂය තුළ සංචාරක කලාපවල අපද්‍රව්‍ය නිසි ලෙස බැහැර කිරීමේ අරමුණින් පළාත් සංවර්ධන නිශ්චිත ප්‍රදාන (PSDG) යටතේ සභාව වෙත ලැබී තිබූ රු.550,000ක් වැයකර කසල බඳුන් 23ක් මිලදීගෙන තිබුණු අතර, මාස 06කට අධික කාලයක් ගතව ඇතත් ඒවා ස්ථානගත කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් මෙම ව්‍යාපෘතියෙහි අරමුණ ඉටු නොවී පැවතුණි. | ඉදිරි සති දෙකක කාලය ඇතුළත දී ඒවා නිසි ස්ථානවල ස්ථාපිත කිරීමට කටයුතු කරන බව. | අවශ්‍ය ස්ථානවල ස්ථාපිත කර භාවිතයට ගත යුතුය. |
| (ආ) ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය යටතේ පානම පිහිටි තානායම සඳහා ගෘහ භාණ්ඩ හා මුළුතැන්ගෙයි උපකරණ මිලදීගැනීමට අදාළව තාක්ෂණික ඇගයීම් කමිටුව සහ ප්‍රසම්පාදන කමිටුව විසින් මිල ගණන් ඇගයීම් සිදු කිරීමේ දී භාණ්ඩවල අවම මිල පමණක් සැලකිල්ලට ගැනීම හා භාණ්ඩ භාර ගැනීමේ දී අපේක්ෂිත ගුණත්වයෙන් යුතු ද යන්න තහවුරු කර භාර නොගැනීම හේතුවෙන් රු.1,044,100ක් වටිනා ඇඳන් 33ක් ඉරිතැලීම්, පලුදුවීම් සහිත නියමිත ප්‍රමිතියෙන් යුක්ත නොවන ඇඳන් බව භෞතික පරීක්ෂාවේ දී තහවුරු විය. | භාණ්ඩ භාර ගන්නා අවස්ථාවේ කිසිදු අඩුපාඩුවක් දක්නට නොතිබුණි. කාලගුණික තත්ත්වය අනුව වෙනස්වීම් සිදු වී ඇත. මෙය ඇඳන් කිහිපයක පමණක් සිදුවිය හැකි අතර අනෙක් ඇඳන් සියල්ල යථා තත්ත්වයෙන් පවතින බව. | දැව භාණ්ඩ මිලදී ගැනීමට පෙර එහි ගුණත්වය පිළිබඳව පරීක්ෂා කර මිලදීගත යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් වන විට සභාවේ තනතුරු 15ක් පුරප්පාඩුව පවතින බව නිරීක්ෂණය වූ අතර මේ හේතුවෙන් සභාවේ දෛනික රාජකාරි පවත්වාගෙන යාමේ ගැටලු මතු වී තිබුණි. | පිළිගන්නා බව | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය සහ මුදල් රෙගුලාසි 133(1) ප්‍රකාරව අභ්‍යන්තර විගණනය මඟින් ආයතනික මෙහෙයුම් ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීම සහ කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා වූ නිර්දේශ සකස් කර නොතිබුණි. | මේ සඳහා ඉදිරියේදී කටයුතු කරන බව. | පනත ප්‍රකාරව ආයතනික මෙහෙයුම් ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීම සහ කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා වූ නිර්දේශ සකස්කර ක්‍රියාත්මක කළ යුතුය. |

## 4.2 විගණන කමිටුව

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2019 ජනවාරි 12 දිනැති අංක DMA/01–2019 දරන අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ පිළිබඳ චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ සභාව විසින් විගණන සහ කළමනාකරණ කමිටු ස්ථාපිත කර කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | 2024 වර්ෂයේ සිට මෙම කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කරන බව. | විගණන හා කළමනාකරණ කමිටුව සඳහා ක්‍රියා පටිපාටි ආරම්භ කර සහ රැස්වීම් පැවැත්වීමට පියවර ගත යුතුය. |

## 4.3 පාරිසරික ගැටලු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභාව විසින් පානම, ලාහුගල හා හුලංනුගේ යන ස්ථාන 03ක පවත්වාගෙන යන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන පාරිසරික පනත යටතේ මධ්‍යම පරිසර අධිකාරියෙන් වලංගු පරිසර බලපත්‍රයක් ලබාගත යුතු වුවත්, සභාව විසින් වලංගු පරිසර බලපත්‍රයක් නොමැතිව ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන පවත්වාගෙන ගොස් තිබුණි. | ඉදිරි කාලයේ දී පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කරන බව. | වලංගු පරිසර බලපත්‍රයක් ලබාගත යුතුය. |

## 4.4 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනත ප්‍රකාරව තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟාකර ගැනීම සඳහා අවශ්‍ය මිනුම් දඬු පිළියෙල කර ඒවාට අදාළ දත්ත රැස්කර තිරසර සංවර්ධන ඉලක්කයන් වෙත ළඟාවීම පිළිබඳ වාර්තා පවත්වාගෙන ගොස් නොතිබුණි. | මේ අනුව ඉදිරියේදී කටයුතු කිරීමට සටහන් කර ගත් බව. | චක්‍රලේඛය ප්‍රකාරව තිරසාර සංවර්ධන පරමාර්ථ සහ අරමුණු ළඟාකර ගැනීම සඳහා අවශ්‍ය දත්ත රැස්කර ඒ සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සැලැසීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගත යුතුය. |